"සුපිරිසිදු දැත් ", දූෂණයට එරෙහි ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ සන්ධානයේ සාමාජිකයකු හා රාජ්‍ය අංශයේ නිලධාරියකු ලෙසට ...................................................................................................වන මම රාජ්‍ය සේවය තුලින් දූෂණය තුරන් කිරීමට කැපවී සිටිමි. රාජ්‍ය සේවයේ කීර්තිය සහ ගෞරවයද රාජ්‍ය සේවය කෙරෙහි පවත්නා මහජන විශ්වාසය ද රඳා පවතින්නේ රාජ්‍ය සේවකයින්ගේ ඒකාග්‍රතාවය මත බව මම දනිමි.

"සුපිරිසිදු දැත්" සන්ධානයේ ව්‍යවස්ථා සංග්‍රහය සමග එකග වන අතර, මම එයින් බැඳී සිටිමි.

සුපිරිසිදු දැත් සන්ධානයේ දැක්ම, මෙහෙය සහ අරමුණු මා කියවා ඇති අතර, හොඳින් අවබෝධ කර ගෙන සිටිමි. ඒවා ඉටු කිරීමට මා සම්පූර්ණයෙන් කැපවීම ඇති අතර, ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා මට ලබා දිය හැකි උපරිම දායකත්වය ලබා දෙමි. සන්ධානයේ අරමුණුවලට පටහැනි හෝ එහි සිද්ධාන්ත හා ගැටෙන කිසිම ක්‍රියාවලියක් හෝ තීරණයක් ගැනීමෙන් මම වැළකී සිටිමි.

"සුපිරිසිදු දැත් " සන්ධානය විසින් අනුමත කර ඇති චර්යා පද්ධතිය මා කියවූ බවත්, හොඳින් අවබෝධ කර ගත් බවත් එයින් මා සම්පූර්ණයෙන් බැඳි සිටින බවත් ප්‍රකාශ කරමි.

දූෂණයට සම්බන්ධ කටයුතු පිළිබඳව ලැබෙන තොරතුරු නියමිත බලධාරීන් වෙත සහ සුපිරිසිදු දැත් සන්ධානය වෙත ලබා දීමට මම කටයුතු කරමි. මාගේ නිල තත්ත්වය හෝ මා භාරයේ පවත්නා රාජ්‍ය දේපළ සහ අනිකුත් වත්කම් අනිසි ආකාරයට පාවිච්චි නොකරන බවටද, ඒවා මාගේ හෝ මාගේ පවුලේ සාමාජිකයින්ගේ හෝ සමීපතමයින්ගේ සුහසිද්ධිය සඳහා පාවිච්චි නොකරන බවටද සහතික වී ප්‍රකාශ කරමි.

මාගේ රාජකාරි ඉටු කිරීමේදී රජයේ ප්‍රතිපත්තිය, රජයේ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බවට දිවුරා අවංකව සහතිකව ප්‍රකාශ කරන අතර, සුපිරිසිදු දැත් සන්ධානයේ අරමුණුවලට අනුකූලව කටයුතු කරන බව ද ප්‍රකාශ කරමි. සුපිරිසිදු දැත් සන්ධානයේ මෙහෙවර වන වගවීමෙන් සහ විනිවිද භාවයෙන් යුක්ත දූෂණයෙන් තොර රාජ්‍ය සේවයක් ඇති කිරීම, ආරක්ෂා කිරීම හා සහතික වීම සඳහා මාගේ ඉහළම දායකත්වය ලබා දෙමි.

......................................................... ..................................................................

අත්සන | දිනය